# දැනුම සාපේක්ෂ ය

සාපේක්ෂතාවාදය යන වචනය අපි බොහෝ විට අසා ඇත්තෙමු. ඇතැම් දැනුම මිනුම තරගවල දී සාපේක්ෂතාවාදයේ නිර්මාතෘ කවුරුන්දැයි අසනු දැකිය හැකි ය. එහි දී ප්‍රශ්න විචාරකයා බලාපොරොත්තු වන පිළිතුර බොහෝ විට "ඇල්බට් අයින්ස්ටයින් "ය. ලෝකයේ සාපේක්ෂතාවාද ඇත්තේ එකක් පමණ ද? ඊට වැඩි ගණනක් ඇත්නම් ඒ එකිනෙක අතර ඇති වෙනස කුමක් ද? දැනුම මිනුම තරගවල දී එයාකාරයේ ප්‍රශ්න යොමු නො වුව ද අද අපි මේ විදුසර සංවත්සර අතිරේකයෙන් එවැනි කරුණක් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු. ලෝකයේ ඇත්තේ සාපේක්ෂතාවාද එකක් පමණක් නො වන බවත් බටහිර බුද්ධිමතුන්, සාපේක්ෂතාවාදය යනුවෙන් හඳුන්වන දැනුමේ සැබෑ සාපේක්ෂතාවාදයක් නොමැති බවත්, සැබෑ සාපේක්ෂතාවාදී දැනුමේ උරුමකරුවන් පෙරදිගයන් බවත් මෙහි දී පෙන්වා දෙනු ලැබ ඇත. ඒ සියල්ලට වඩා මෙරට චින්තනය මත පදනම් ව ගොඩනැගුණු සාපේක්ෂතාවාදයක් ගැනත් ඒ දැනුම පසුගිය විසිවසරක පමණ කාලය තුළ ඇති කර ඇති බලපෑම ගැනත් මෙහි දී සාකච්ඡා වේ.

ගැලිලියෝ ගැලිලි සහ අයිසැක් නිව්ටන් ද සාපේක්ෂතාවාදී අදහස් ප්‍රකාශ කර ඇති බව ඇතැම් තැන්හි ප්‍රකාශ වේ. එහෙත් එහි දී සාපේක්ෂ බවක් ගැන කතා කරන්නේ යම් යම් චලිතයන්ට අදාළව ය. එසේ නැති ව දැනුම සම්බන්ධයෙන් නො වේ. සාපේක්ෂතාවාදයක් ගැන කෙසේ වෙතත් සාපේක්ෂ චලිතයක් ගැන හෝ නො දැන සිටි බටහිරට සාපේක්ෂ චලිතය හඳුන්වා දුන්නේ ගැලිලියෝ ගැලිලි ය. ඒ සඳහා බොහෝ විට ඔහුට පෙරදිග ආභාසයක් ලැබෙන්නට ඇත. ගැලිලියෝ පැවසුයේ අපට පෙනෙන්නේ දැනෙන්නේ සාපේක්ෂ චලිත පමණක් බවයි. යම් චලිතයක අප ද කොටස්කරුවන් නම් එම චලිතය අපට නො පෙනෙනනො දැනෙන බව ඔහු පැවසී ය. මේ ඔස්සේ ගැලිලියෝ පෘථිවිය තම අක්ෂය වටා භ්‍රමණය විය හැකි බවත් ඒ චලිතය අපට නො දැනෙන්නේ අප ද එම චලිතයේ නියැළෙන නිසා බවත් පැවසී ය. කෙසේ වෙතත් චලිතයේ නිරපේක්ෂ බව ගැන ගැලිලියෝට ප්‍රශ්නයක් නො වී ය. නිරපේක්ෂ චලිතය එක් එක් නිරීක්ෂකයාට සාපේක්ෂ විය. පසුව නිරපේක්ෂ චලිතයේ සාපේක්ෂ බව ගැන නිව්ටන් විද්වතා දිගින් දිගට ම කතා කළ අතර ඔහුට අනුව සියලු චලිත සිදු වුයේ නිරපේක්ෂ කාලයක සහ අවකාශයක ය.

බටහිර චින්තනය තුළ, බටහිර දැනුම් පද්ධතිය තුළ සාපේක්ෂතාවාදය ගැන ප්‍රබල ලෙස කතා කෙරෙන්නේ ඇල්බට් අයින්ස්ටයින් විද්වතා ගේ නම සමග ය. හෙතෙම ක්‍රි.ව. 1905 වසරේ දී විශේෂ සාපේක්ෂතාවාදයත් ඊට වසර දහයකට පසු සාධාරණ සාපේක්ෂතාවාදයක් ඉදිරිපත් කළ බව පැවසේ. අයින්ස්ටයින් විද්වතා විශේෂ සාපේක්ෂතාවාදයේ දී කාලයේ නිරපේක්ෂ බව යම් ආකාරයකට ප්‍රතික්ෂේප කළේ ය. ඒ ඒ නිරීක්ෂකයා කාලය මනින්නේ අදාළ නිරීක්ෂකයාට සාපේක්ෂව බව එහි දී පැවසිණි. එසේ නම් අයින්ස්ටයින් විද්වතා බටහිර ලෝකයේ නිරපේක්ෂතාව සුනු විසුනු කර දැමී ද? එතැන් සිට බටහිර දැනුමේ නිරපේක්ෂබවට තැනක් නො වී ද? සැබැවින් ම අයින්ස්ටයින් විද්වතා සිදු කළේ කාලයට යම් ආකාරයක සාපේක්ෂ බවක් ලබා දී ඊටත් වඩා ප්‍රබල නිරපේක්ෂ සංකල්පයක් නිර්මාණය කිරීමයි. එය අවකාශ කාලය නම් විය. ඒ අනුව නිරීක්ෂකයා ගෙන් නිරීක්ෂකයාට සිද්ධි දෙකක් අතර කාලය වෙනස් විය හැකි වුව ද අවකාශ කාලය වෙනස් නො වේ. එනම් අවසාන වශයෙන් අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදයේ ද ඇත්තේ නිරපේක්ෂ බවකි. මෙහි දී ද කිසි විටකත් නිරීක්ෂකයා ගෙන් ස්වායත්ත ව වස්තු ඇතැයි යන්න බැහැර නො කෙරිණි. මුළු මහත් බටහිර චින්තනයත්, බටහිර දැනුම් පද්ධතියත් වෙන් කළ නොහැකි ලෙස නිරපේක්ෂබව හා බැඳී ඇත. යම් ආකාරයකට එම නිරපේක්ෂබව ප්‍රතික්ෂේප කරමින් දැනුමක් බටහිර විද්වතුන් අතින් ගොඩනැගුණු හොත් එය අප පවසන ආකාරයේ බටහිර දැනුමක් නො වනවා මෙන් ම අප පවසන අරුතින් එම විද්වතුන් තවදුරටත් බටහිරයන් ද නො වනු ඇත. එනම් නිරපේක්ෂ බටහිරක් ගැන අපි කතා නො කරමු.

වත්මන් බටහිර චින්තනයට හෝ එම චින්තනය ආධිපත්‍යය දැරීමට පෙර යුරෝපයේ පැවැති ප්‍රමුඛ චින්තනයට නිරපේක්ෂබවෙන් ගැලවීමට නොහැකි වුව ද පෙරදිග චින්තනවලට එවැනි ප්‍රශ්නයක් නො වී ය. පොදු වශයෙන් දකුණු ආසියානු සහ අග්නිදිග ආසියානු ප්‍රදේශවල බලවත් වු සියලු ම චින්තනවල සාපේක්ෂබවට යම් තැනක් විය. වෛදික චින්තනය මත ගොඩනැගුණු ජ්‍යොතිෂ්‍යයේ ද, ආයුර්වේදයේ ද සාපේක්ෂබවට ඉහළ තැනක් හිමි ය. අවශ්‍ය විටක ඉර පොළොව වටා යන ලෙසත් තවත් විටෙක පොළොව ඉර වටා යන ලෙසත් ගැනීමට වෛදික උගත්තු දැන සිටිය හ. ආයුර්වේදයේ ද ප්‍රතිකාර ක්‍රම රෝගියාට සාපේක්ෂ විය. බුදු සමය මුළුමනින් ම පාහේ සාපේක්ෂතාවාදී දහමකි. කෙසේ

වෙතත් පෙරදිග කලාපයේ සාපේක්ෂබවක් ගැන කතා කළේ හුදු කාලයට, චලිතයකට හෝ වෙනත් එවැනි යමකට අදාළ ව නො ව මුළු මහත් දැනුම් පද්ධතියකට, ජීවිතයට, සංසාරයට හෝ ලෝක ධාතුවට අදාළ ව ය.

ක්‍රි.ව. 2 වන සියවසේ දකුණු ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයේ වාසය කළ නාගර්ජුන හිමියෝ ද සාපේක්ෂතාවාදයක් ඉදිරිපත් කළ හ. එය ඇතැම් විට මාධ්‍යමික සාපේක්ෂතාවාදය ලෙස හැඳින්වේ. යම් සංකල්පයක් නිවැරැදිව තේරුම් ගත හැක්කේ එකී සංකල්පයේ ප්‍රතිවිරුද්ධය ද තේරුම් ගැනීමෙන් බව උන්වහන්සේ පැවසූ හ. අඳුර යනු ආලෝකයේ ප්‍රතිවිරුද්ධයයි. අඳුර ගැන අවබෝධයක් ලැබීමට ආලෝකය ගැන ද අවබෝධයක් තිබිය යුතු ය. ඒ අයුරින් නිර්වාණය අවබෝධ කරගත හැක්කේ සංසාරය පිළිබඳ අවබෝධයෙන් බව නාගර්ජුන හිමියෝ පැවසූ හ.

මේ ආකාරයට විවිධ නම්වලින් හැඳින්වෙන සාපේක්ෂතාවාද අතර නිර්මාණාත්මක සාපේක්ෂතා-වාදය යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද? ඉන් කියැවෙන්නේ කුමක සාපේක්ෂබවක් ගැන ද?

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙන් පැවසෙන්නේ ලෝකයේ සාපේක්ෂබවයි. දැනුමේ සාපේක්ෂබවයි. මේ ලෝකය නොඑසේ නම් දැනුම සාපේක්ෂ වන්නේ කුමකට ද? කාට ද? එය හුදු නිරීක්ෂකයාට සාපේක්ෂ බව පමණක් ද? සැබැවින් ම නැත. ඉන් පැවසෙන්නේ ලෝකය දැනුම අප එකිනෙකා ගේ මනසට, ඉන්ද්‍රිය පද්ධතියට සහ සංස්කෘතියට සාපේක්ෂ බවයි. එනම් එහි දී නිරපේක්ෂ බව මුළුමනින් ම ප්‍රතික්ෂේප වේ. ඔබ කියවන මේ විදුසර පුවත්පත මා කියවන විදුසර පුවත්පතෙන් වෙනස් ය. එය වෙනස් වන්නේ එක ම විදුසර පුවත්පත අප එකිනෙකා විවිධ අයුරට දකින, කියවන, අවබෝධ කරගන්නා නිසා නො වේ.

මා ගේ විදුසර මා නිර්මාණය කරගත් එකකි. ඔබ ගේ විදුසර ඔබ නිර්මාණය කරගත් එකකි. මගේ විදුසර මගේ මනසට, ඉන්ද්‍රිය පද්ධතියට සහ සංස්කෘතියට සාපේක්ෂ වන අතර ඔබේ විදුසර ඔබේ මනසට සංස්කෘතියට සාපේක්ෂ වේ. මගේ සහ ඔබේ සංස්කෘතිය එකක් විය හැකි වුව ද ඔබේ මනස සහ ඉන්ද්‍රිය පද්ධතිය මගේ මනස සහ ඉන්ද්‍රිය පද්ධතිය නො වන බව අමුතුවෙන් කිව යුතු නො වේ. කොටින් ම කිව හොත් කාලය ද සාපේක්ෂ ය. චලිතය ද සාපේක්ෂ ය. නිව්ටන් ද සාපේක්ෂ ය. අයින්ස්ටයින් ද සාපේක්ෂ ය. ලෝකය පිළිබඳ අප එකිනෙකා සතු සියලු ම දැනුම ද සාපේක්ෂ ය. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම පිළිබඳ අපේ ඇති අනවබෝධය එනම් අවිද්‍යාව නිසා අපි මේ දැනුම නිර්මාණය කරගෙන ඇත්තෙමු.

ඕනෑ ම දැනුමක් මේ ආකාරයට සාපේක්ෂ නම් දැනුම ගැන කියැවෙන මේ දැනුම ද සාපේක්ෂ විය යුතු නො වේ ද? ඔව්, සැබැවින් ම එය ද සාපේක්ෂ ය. මේ ආකාරයේ දැනුමක් නිර්මාණය කළේ නලින් ද සිල්වා විද්වතා ය. එය නිර්මාණය වුයේ එතුමා ගේ මනසට, ඉන්ද්‍රිය පද්ධතියට සහ සංස්කෘතියට සාපේක්ෂ ව ය. මේ දැනුම අසා හෝ කියවා ඔබට හෝ මට ද අවබෝධයක් ලැබිය හැකි ය. ලෝකය තේරුම් ගැනීමට එම දැනුම යොදාගත හැකි ය. එහෙත් ඒ මගේ දැනුමක් නොඑසේ නම් ඔබේ දැනුමක් ලෙස ය. මන්ද සියල්ලෙහි නිර්මාපකයා තමා ම වන හෙයිනි. මේ දැනුම නිර්මාණය කළ විද්වතා සහ ඔබ හෝ මම හෝ එක ම සංස්කෘතියක ජීවත් වීම එවන් නිර්මාණයක් කිරීම පහසු කරවයි. කෙසේ වෙතත් සියල්ල මා විසින් ම නිර්මාණය කරගැනුණු පමණින් එවැනි දෙයකට අවශ්‍ය මගපෙන්වීම ලබා දුන්නේ කවුරුන් ද යන වග පැවසීමට හෝ ඒ ආකාරයේ දැනුමක් මුල් වරට නිර්මාණය කළේ කවුරුන් ද යන වග පැවසීමට පසුබට විය යුතු නො වේ.

දැනුම පිළිබඳ දැනුම නොඑසේ නම් දැනුම පිළිබඳ ප්‍රවාදය හැඳින්වෙන්නේ ඥාන විභාගය යනුවෙනි. ඥාන විභාගය යනු චින්තනයක ප්‍රධාන කොටස් තුනෙන් එකකි. දාර්ශනික පසුබිම සහ ආකල්ප අනෙක් කොටස් දෙකයි. මේවා එකිනෙක බැඳී ඇතැයි සැලකිය හැකි ය. මේ අනුව නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යනු හුදු සාපේක්ෂතාවාදයක් පමණක් නො ව ඥාන විභාගයක් ද වේ. එය සිංහල බෞද්ධ චින්තනයේ ඥාන විභාගයයි.

මේ සමග ම "චින්තනය " ගැන ද යමක් පැවසීම සුදුසු ය. බොහෝ විට චින්තනය යන්න සාමාන්‍ය ව්‍යවහාරයේ දී යෙදෙන්නේ "සිතීම" යන අරුතින් ය. එහෙත් මෙහි චින්තනය ලෙස හැඳින්වෙන්නේ ඊට වඩා ගැඹුරු සංකල්පයකි. අඛණ්ඩ සංස්කෘතියක් ඇති ජාතියක කලාව, සාහිත්‍යය, සංගීතය, සිරිත් විරිත් මේ සියල්ල ගොඩනැගෙන්නේ

චින්තනයක් මත ය. එනම් චින්තනය දැනුම නිර්මාණයේ පාදමයි. යම් ජාතියක චින්තනය "ජාතික චින්තනය" ලෙස හැඳින්විය හැකි ය. "ජාතික චින්තනය" යන යෙදුම මුල් වරට යෙදුවේ වෛද්‍ය ගුණදාස අමරසේකර මහතා බව පැවසේ. එම යෙදුම ඒ මහතා යොදා ගැනීමට හේතු වුයේ History of Russian thoughts නම් අන්ද්‍රියෙෆ් වැලකිගේ කෘතිය පිළිබඳව ජෝෂප් ෆ්‍රැන්ස් නම් විචාරකයකු ලියූ ලිපියක වූ අදහසක් බව කියැවේ. අමරසේකර මහතා චින්තනය යන්න යෙදුවේ Thought නම් ඉංග්‍රිසි වචනය වෙනුවට බව පෙනී යයි. කෙසේ වෙතත් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ අදහස් ශක්තිමත් වීම හා සමගාමීව "චින්තනය" යන්නට ද නව අරුතක් ලැබිණි. "සිතීම" ඉක්මවා ගිය ගැඹුරු දාර්ශනික අරුතක් "චින්තනය"ට ලැබුණේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙන් ලැබුණු දාර්ශනික පන්නරය සමඟ ය.

*රජරට වෛද්‍ය පීඨයේ කථිකාචාර්ය*

**වෛද්‍ය චන්න සුදත් ජයසුමන**